# නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය

## නාගරික සංවර්ධන, වෙරළ සංරක්ෂණ, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය

# සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය - උපදේශක මට්ටමින් වෘත්තිකයින් කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම

සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ සේවය සඳහා පහත සඳහන් වෘත්තීය සුදුසුකම් හා සේවා පළපුරුද්ද ඇති වරලත් නගර නිර්මාණ ශිල්පියෙකු හා නීතිඥවරයෙකු උපදේශක මට්ටමින් කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

1. **වරලත් නගර නිර්මාණ ශිල්පියෙකු සඳහා සපුරාලිය යුතු සුදුසුකම්**

   රාජ්‍ය අංශයේ හෝ පෞද්ගලික අංශයේ වරලත් නගර නිර්මාණ ශිල්පියෙකු වශයෙන්, නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් රෙගුලාසි හා සහාධිපත්‍ය දේපළ සංවර්ධන හා සැලසුම් පිළිබඳ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වර්ෂ 30 ක සේවා පළපුරුද්ද සම්පූර්ණ කර තිබිය යුතුය.

2. **නීතිඥවරයෙකු සඳහා සපුරාලිය යුතු සුදුසුකම්**

   පිළිගත් විශ්වවිද්‍යාලයක නීතිවේදී උපාධිය සමඟ නීතිඥවරයකු වශයෙන් වසර 20කට වැඩි පළපුරුද්දක් තිබිය යුතු අතර ඉන් වසර 10කට වැඩි කාලයක් සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරි පනත ක්‍රියාවට නැංවීම පිළිබඳව සේවා පළපුරුද්දක් තිබිය යුතුය. මීට අමතරව නිවාස හා දේපළ කළමනාකරණ ක්ෂේත්‍රයේ සේවා පළපුරුද්දක් ඇති අයදුම්කරුවන් කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

මේ සඳහා සුදුසුකම් ඇති වෘත්තිකයින් අධ්‍යාපන, වෘත්තීය සුදුසුකම්, පළපුරුද්ද යනාදිය ඇතුළත් ජීව දත්ත අයදුම්පතක් ලියුම් කවරයේ ඇතුළත් කොට වම්පස ඉහළ කෙළවරෙහි **"සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය - උපදේශක මට්ටමින් වෘත්තිකයින් කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම"** යනුවෙන් සඳහන් කොට පහත සඳහන් ලිපිනයට **2021.01.21** දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

**සභාපති, සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය,**
**1 වන මහල, ජාතික නිවාස දෙපාර්තමේන්තු ගොඩනැගිල්ල,**
**ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත,**
**කොළඹ - 02**